# කාර්යසාධන වාර්තාව 2012 මන්නාරම දිස්ත්‍රික්කය

1. **දිසාපතිගේ පණිවුඩය**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 වසර සඳහා කාර්ය සාධනය සහ ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීමේදී ඉමහත් සතුටට පත්වෙමි. මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, එහි ප්‍රාදේශිය ලේකම් කාර්යාල පහ සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන අනෙක් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල උප කාර්යාල වල කාර්ය සාධනය මෙම 2012 වසර වාර්තාවෙන් ඉදිරිපත්කරමි.

2012 වසරේ ඇස්තමේන්තු මගින් භාණ්ඩාගාරය විසින් මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට වෙන් කරන ලද ප්‍රතිපාදන අරපරිස්සමෙන් සහ ඵලදායි ලෙස වැයකර ඇත. මෙමගින් ජනතාව සඳහා පොදු සේවා කටයුතු සහ සංවර්ධන කටයුතු කඩිනම් කර ඇත. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමග ඒකාබද්ධව සියළු සේවා සපයන ශාඛාවන් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල පූර්ණ කැපවීමෙන් කටයුතු කර ඇත.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන වෙන් කිරීම මගින් මහින්ද චින්තනය යටතේ දිවි නැගුම සැලැස්ම ප්‍රශස්ත අයුරින් දියත් කර ඇත. රේඛීය අමාත්‍යාංශ මගින් ලබා දුන් ප්‍රතිපාදන යටතේ ඉදිරි පිටුවල සඳහන් වැඩසටහන් ඵලදායි ලෙස ඉටු කර තිබේ.

අවසාන වශයෙන් මෙම දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවශ්‍යතාවයන් සහ සංවර්ධන සේවාවන් ගුණාත්මක බවින්ද ඵලදායී ලෙසද සිදු කිරීමට විවිධාකාරයෙන් සහයෝගය සහ උපදෙස් ලබා දුන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ අනෙක් දෙපාර්තමේන්තුවලට මාගේ ස්තුතිය පිරිනමමි. මෙම දිස්ත්‍රික්කයේ සියළුම අදාල නිළධාරින්ගේ සහය නිසිපරිදි නොලැබුණේ නම් මෙම කාර්යයන් මෙලෙසින්ම නියාමනය කිරීමට මට නොහැකිවනු ඇත. එහෙයින් ඔවුනටද මේ අවස්ථාවේ මගේ ස්තුතිය එල කරමි.

ස්තුතියි.

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්යභාරය

### 2.1. දැක්ම

ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම උදෙසා මන්නාරම දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම.

### 2.2. මෙහෙවර

දිස්ත්‍රික්කයේ සංවර්ධනය උදෙසා දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශිය මට්ටමේ පවතින ආයතනවල ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම හා රජයේ සහ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ඨ කිරීම සඳහා කාර්යසාධනය වැඩි දියුණු කිරීම සහ කාර්යක්ෂමව හා ඵලදායිව සේවා සැපයීම හා අවම පිරිවැයෙන් අවශ්‍යතාවයන් ඉටු කිරීම.

කාර්යක්ෂමතාවය සඳහා දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය.

### 2.3. දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය ලෙකම් කාර්යාල පරිපාලන කටයුතු සිදු කිරීම

- සේවකයින් සම්බන්ධව සියලු කටයුතු සිදුකිරීම(පුද්ගලික ලිපි ගොණු, නිවාඩු,වැටුප්, අතිකාල දීමනා, නිවාඩු දින දීමනා, සේවක ගමන් බලපත්‍ර , ණය සහන)

- **පොදු ජනතාව සඳහා සේවය ලබා දීම සහ ඒවා පහසුවෙන් ලබා ගැනීම සඳහා මාර්ග සැකසීම.**

  ✓ ගමන් බලපත්‍ර ,හැදුනුම්පත් ලබා දීම, මෝටර් ප්‍රවාහන බද්ධ, ව්‍යාපාර අවසර පත්‍ර, උප්පැන්න මරණ සහ විවාහ සහතික.මාර්ග ප්‍රවාහන බලපත්‍ර ලබාදීම.

  ✓ රියදුරු බලපත්‍ර ලබාදීම.

  ✓ ජන්ද හිමියන් ලියාපදිංචි කිරීම.

  ✓ ඉඩම් ඔප්පු සහ බලපත්‍ර ලබාදීම විධිමත් කිරීම සහ ඉඩම් ගැටළු විසඳීම.

  ✓ වැඩිහිටි සහ ආබාධිත අය සඳහා මාසික සහනාධාරය.

  ✓ මහජනතාව සඳහා මානසිකත්වය නංවාලීම සඳහා කටයුතු කිරීම.

  ✓ රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා පුහුණු සහ කාන්තා ගෘහමූලික පවුල් සඳහා ස්වයංරැකියා පුහුණුව හා දිරිගැන්වීම්.

**ලේකම් කාර්යාලයේ අරමුණු කරා ලඟාවීම සඳහා කාර්යක්ෂම ලෙෂ ප්‍රතිපාදන ලබා දී ගිණුම් ක්‍රම අනුගමනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.**

  ✓ දිස්ත්‍රික්කයට වෙන් කරන ලද වාර්ශික ප්‍රතිපාදන නිසි අනුමැතිය සමග ඵලදායි ලෙෂ භාවිත කිරීම සහ ගණන් තැබීම.

✓ සෙවකයන් සඳහා සියළු දීමනා ලබාදීම.

✓ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තිබෙන මුදල් නිසි අවසරය මත අදාල අවශ්‍යතාවයන් සඳහා භාවිත කිරීම.

✓ මාසික වාර්ෂික වාර්තා දෙපාර්තමේන්තුවලටද අමාත්‍යංශ වලටද භාණ්ඩාගාරයටද යැවීම.

✓ දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශිය ලෙකම් කාර්යාල විසින් ලබාගතු ලබන සෙවා සඳහා දීමනා.

✓ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්ෂික ලැබීම් සැලසුම් සකස් කිරීම.

**දිස්ත්‍රික් කලා සංස්කෘතික කටයුතු සහ කාර්යක්ෂමතාවය සවිමත් කිරීම සඳහා කටයුතු සිදු කිරීම ඒ සඳහා මාර්ග සකස් කිරීම**.

සංස්කෘතික උත්සව පැවැත්වීම දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ වැඩසටහන්

**දිස්ත්‍රික්කයේ තිබෙන සම්පත් කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සහ ඒ සඳහා සැලසුම් සකස් කිරීම**.

දිස්ත්‍රික් ඉඩම් පරිහරන සැලසුම් අංශය ද්ත්‍රික් රංකියා පුහුණු මධ්‍යස්ථානය දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය.

**පොදු ජනතාව ආරක්ෂා කිරීම පොදු ජනතාව සඳහා අත්‍යාවශ්‍ය සෙවා ලබාදීම**.

රාජ්‍ය නොවන සංවිධාන සමග ඒකාබද්ධව දිස්ත්‍රික්කයේ ඇතිවන ආපදා වලදී (ගං වතුර සුළිසුළං අධික වර්ෂාව ඉඩෝරය) ජනතාව ආරක්ෂා කිරීම මේ සඳහා පොලිසිය සහ යුධ හමුදාව නාවික සහායද ලබා ගණෙිනි.

**දිස්ත්‍රික්කයේ තිබෙන සියළු සංඛ්‍යාලේඛණ තොරතුරු එක්රැස් කිරීම සහ ආරක්ෂකිරීම**.

මෙය අපේ සංඛ්‍යාලේඛන අංශය විසින් සිදු කරයි.

**ප්‍රාදේශිය ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා සැලසුම් සකස් කිරීම හා සංවිධානය කිරීම**.


1. මාර්ග සංවර්දනය වාරි මාර්ග විදුලි පහසුකම්.
2. විමධ්‍යගත අයවැය මගින් ලැබෙන ප්‍රතිපාදන වලින් දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සිදු කිරිම හා අධීක්ෂණය කිරීම.
3. දැනට රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.(දිවිනැගුම ගම නැගුම මග නැගුම)
4. නිවාස සැලසුම්.
5. යුද්ධයෙන් පිඩාවට පත්වූවන් සඳහා වන්දි ලබාදීම.

# කාර්යසාධන වාර්තාව 2012

## 01 හැඳින්වීම

### ➢ දිස්ත්‍රික්කයේ මායිම්

ශ්‍රී ලංකාවේ වයඹ දෙසට උතුරින් මන්නාරම දිස්ත්‍රික්කය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ දකුණු දිසාවෙන් පුත්තලම දිස්ත්‍රික්කය, ගිණිකොන දිසාවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය, නැගෙනහිර දිසාවෙන් වවුනියා දිස්ත්‍රික්කය ඊසාන දිසාවෙන් මුලතිවු දිස්ත්‍රික්කය හා උතුරු දිසාවෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කය ද මායිම් ලෙස පිහිටා ඇත




### ➢ වැදගත් ස්ථාන

තිරුකේතීශ්වරම් කෝවිල, මරදු මඩු දේවස්ථානය, ඕලන්ද කොටුව, අරිප්පු කොටුව, අරිප්පු අල්ලිරාණි කොටුව, රාමා (ආදම්ගේ) පාලම, වැල් පාලම, බයෝබැබ් ගස හා ප්‍රදීපාගාරය දිස්ත්‍රික්කය තුළ වැදගත් ස්ථාන වශයෙන් හඳුන්වා දිය හැක.


Thiruketheeswaram temple


Madhu Church


Biobab Tree


Gueen Alli fort

ශ්‍රී ලංකාවෙ ප්‍රසිද්ධ කෝවිල් අතුරින් මෙම තිරුකේතීශ්වරම් කෝවිල ප්‍රමුඛ වේ. 'නායන්වල' වෙද ගීත ගායනයෙහි ප්‍රසිද්ධ දේවාලයක් ඇත. මන්නාරම සිට උතුරු දිසාවට දළ වශයෙන් සැතපුම් 6.5 ක් පමණ දුරින් වයම මුහුදේ සිට දළ වශායන් සැතපුම් 0.5 ක් දුරින් තිරුකේතිශ්වරම් කෝවිල පිහිටා ඇත. 16 වන ශත වර්ශයේදී මෙම කෝවිල පෘතුගීසින් විසින් සම්පූර්ණයෙන්ම විනාශතර තිබේ. 1903 වසරේ මෙය ප්‍රතිසංස්කරනය කරන ලදි.ප්‍රතිසංස්කරනයෙන් පසු 1952 වසරේ මෙහි මුල්ම (කුම්බාභිශේක) පූජාව සිදුකරන ලදි.

වන්නි වන සංරක්ෂිතයට අයත්ව පිහිටා තිබෙන ඉතා පැරණි මරුද මඩු දේවස්ථානය ලොවපුරා බැතිමතුන්ගේ පුද බිමකි. වාර්තාවලට අනුව 1659 වසරේ පෙබරවාරි මස 22 දින ඕලන්ද ආක්‍රමනය විසින් මන්නාරම යටත්කොටගත් අවස්ථාවේ මෙහි පුද පූජා පැවැත්වීම තහනම් කර ඇත. මාන්තෛ ග්‍රාමයේ සිට වන්නි කැලැවේ පිහිටා ඇති වැවට ආසන්නම ප්‍රදේශයේ මරුද මඩු සුරුවම දැන් පිහිටා ඇති ස්ථානයට ගෙන ගොස් ඇත.

මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධියට එක් හේතුවක් වන බයෝබැබ් ගස ශත වර්ෂ 8 කට පෙර අරාබි ජාතිකයන් විසින් ගෙන එන ලදි. මන්නාරම පල්ලිමුනේ ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ගස මීටර 7.5 ක් උසින් හා වට ප්‍රමාණය මීටර 19.5 කින් යුක්තය.මෙම ගසෙහි වයස දල වශයෙන් වසර 750 ක් පමණ වේ. වෙළඳාම් කටයුතු හේතුවෙන් ලංකාවට පැමිණි අරාබියානු ජාතිකයන් ඔවුන්ට ආහාර සැපයීම සඳහා මෙම ගස් පැලකර ප්‍රයෝජනයට ගෙන ඇත.

මෙම අල්ලිරාණි කොටුව මන්නාරම නගරයේ සිට දළ වශයෙන් කිලෝමීටර් 45ක් දුරින් මුත්තරිප්පුතුරයි ප්‍රදේශයෙහි පිහිටා ඇත. මෙහි මාතොට දක්වා උමං මාර්ගයක් ඇති බවට විශ්වාස



HOUSE OF THE FIRST BRITISH GOVERNOR OF CEYLON, HONORABLE FREDERIC NORTH. BUILT AT A STONE CAST DISTANCE FROM THE SEA, THE MANSION HAD FOUR SMALL BED ROOMS ON THE GROUND FLOOR WITH A FLIGHT OF STAIRS AT THE CENTRE & HAD ONE LARGE DINING HALL WITH HIS EXCELLENCY'S BED CHAMBER ON ITS FIRST FLOOR. PLANNED BY THE GOVERNOR HIMSELF, THE DESIGN WAS PURELY "DORIC" AND WAS BUILT IN 1804 TO REVIVE & SUPERVISE PERSONALLY THE PEARL FISHERY OFF KONDACHCHI BAY, WHICH WAS A CONSIDERABLE SOURCE OF REVENUE FOR THE WESTERN RULERS FOR CENTURIES.

"IT IS UNDOUBTEDLY THE MOST BEAUTIFUL BUILDING IN THE ISLAND & ALMOST THE ONLY ONE WHICH IS PLANNED ACCORDING TO ANY ORDER OF ARCHITECTURE"
- Reverend James Cordiner (DESCRIPTION OF CEYLON-1807)

COURTESY - SRI LANKA NAVY


කරයි. එහි විවිධ කොටස් මුහුදු කාදනය නිසා විනාශ වී ඇති අතර ඉතිරිවී ඇති කොටස් ඒ පිලිබඳව ශාක්ෂි දරයි. මෙම අල්ලිරාණි කොටුවෙහි පහත මාලයේ කුඩා නිදන කාමර 04 කින් හා පලමු මහල විශාල ප්‍රමාණයේ භෝජන ශාලාවකින්ද, සුඛෝපභෝගි නිදන කාමරයකින්ද සමන්විත වී තිබේ. 1804 ඩොරික් මහතා විසින් මෙහි පිඹුර සකසා ඔවුන්ගේම අධීක්ෂනය යටතේ ඉදිකරනු ලැබී යැයි විස්වාශයක් පවති.





මෙම වැල් පාලම 1985 වසරේ මල්වතු ඔය හරහා ගමන් කිරීම සඳහා සාදන ලදි. මෙම පාලම මන්නාරම ප්‍රධාන මාර්ගයේ මඩු හන්දියට නුදුරින් පිහිටි කුංජුකුලම් ප්‍රදේශයේ පිහිටා තිබේ. පාලමෙහි දිග මීටර 150 ක් සහ පලල මීටර 1.2 ක් පමණ වේ.





මෙම කොටුව පෘතුගීසීන් විසින් ඉදිකරන ලදි. 1658 ඕලන්ද ජාතිකයින් විසින් මෙය අත්පත් කරගෙන ඇත. 11 වන රාජසිංහ රජුගේ සිරකරුවෙකු වූ රොබට් නොක්ස්, රජුගෙන් මිදී පැමිණියේ මෙම කොටුවටය. මෙම ඉංග්‍රිසි ජාතික රොබට් නොක්ස් 11 වන රාජසිංහ රජු 1659 වසරේ අල්ලාගෙන ඇත. පසුව ශ්‍රී ලංකාවේ පෙඩ්‍රික් නෝත් ආණ්ඩුකාර වරයාගේ නිලධාරීන්ගේ සංචාරික නිවාසය වශයෙන් භාවිත කර ඇත.




මෙය ඉදිකරන ලද්දේ 1915 වසරේය.මෙහි උස අඩි 64 කි. සෑම විනාඩි 5 කට වරක් පුරාවට මෙයන් ආලෝකය විහිදුවයි. මුදු සැතපුම් 10 දුර ප්‍රමානයකින් දැකීමට හැකි බව කියති. මෙම ප්‍රදීපාගාරය මන්නාරමේ සිට වයඹ දිසාවේ පිහිටි තලෙමන්නාරමෙහි ඉදිකොට ඇත. තලෙමන්නාරමේ සිට ඉන්දියාවට ගමන් කිරීමට කෙටිම මාර්ගය පිහිටා ඇත්තේ මෙහිය.




මෙය පෘතුගීසින් විසින් 1560 වසරේ ඉදිකර ඇත. මෙම බලකොටුව දැවැන්ත බිත්ති 4කින් සමන්විතය. යුධමය කාලය තුළදී යුධ සෙබළුන් හට මුහුදු මගින් ගමන් කිරීමට හැකිවන පරිදි ආරක්ෂාව සැපයීමට මෙය ඉදිකොට ඇත. පසුව මෙම බලකොටුව ඕලන්ද නාවික හමුදාවේ ප්‍රයෝජනයට ගෙන ඇත.




මෙම පාලම වැලි හා හුණු ගල් මිශ්‍රව ඉන්දියාව හා ලංකාව එක් කිරීම සඳහා ස්වභාවිකව පිහිටා ඇත. මෙම පාලම දෙමළ මාධ්‍යයෙන් රාමා පාළම ඉංග්‍රීසි භාෂාවෙන් ආදම් පාළම වශයෙන් හා මළයාල භාෂාවෙන් රාමසේදු පාළම යනුවෙන් හඳුන්වනු ලබයි. මෙහි කිලෝ මීටර 30 ක් දිගින් හා ජල මට්ටම යටින් මීටර 1.5-3.5 අතර වැලි කන්දක් ඇත. පුරාතන යුගයේ ලේඛනවල සඳහන් පරිදි 15 වන ශත වර්ෂයේ මෙම පාළම ඔස්සේ ජනතාව ගමන් කළ බව පැවසේ.




කිතුනු බැතිමතුන්ගේ මෙම දේවස්ථානය 18 ශත වර්ෂයට පෙර සාදා වෙට්ටිමේරි (පේසාලේ) ප්‍රදේශයෙහි පිහිටා ඇත. 2004 වසරේ නැවත ප්‍රතිසංස්කරනය කරන ලදි. වර්ග අඩි 17000 ක් පමණ ඉඩ පහසුකම් ඇති පැරණි දේවස්ථායකි.

## ➢ දිස්ත්‍රික්කයේ දේශගුණික තත්ත්වය

මන්නාරම දිස්ත්‍රික්කය ඉතා උෂණ අධික ප්‍රදේශයකි. වර්ෂාව නැති උෂණාධික දිස්ත්‍රික්කයක් බවට හඳුන්වයි. මන්නාරම දිස්ත්‍රික්කයේ උස්නත්වය 28C– 32C වන අතර වර්ෂාව මිලිමීටර් 74 - මිලිමීටර් 104 අතර පවති.

## ➢ දිස්ත්‍රික්කයේ ආර්ථික හා ජීවනෝපාය තත්වයන්

මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයන් වශයෙන් කෘෂිකර්ම හා ධිවර කර්මාන්තය හැඳින්විය හැකිය. 70% ක් කෘෂිකර්මය, 25% ක් ධීවර, 5% වෙනත් රැකියවල නිරතවෙන අතර 61.4% වී වගාකිරීමට යොමු වී සිටියි.

## ➢ දිස්ත්‍රික්කයේ වාරි මාර්ග කටයුතු

### ✓ තේක්කම් බැම්ම

මෙය මල්වතු ඔය හරහා ඉදිකර ඇති අතර ඇල මාර්ග දෙකක් හරහා ජලය හරවා යවා ඇත. එහි එක් ඇල මාර්ගයක් කට්ටුකරෛ වැව හා අනෙක් ඇල මාර්ගය යෝධ වැව හරහා ගලා යාමට සලසා ඇත.අතිරේක ජලය මල්වතු ඔය හරහා මුහුදට යවනු ලැබේ.

### ✓ යෝධ වැව

1969 වසරේ සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම වැවේ කටයුතු කරනු ලැබේ. මෙම වැවට ජලය සැපයුම් 16.25 ට වඩා මල්වතු ඔයේ ඇල මාර්ගයක් මගින් ගෙන එයි. මෙම වැවේ අක්කර 31,500 පමණ ප්‍රමාණයක ජලය රැඳා පවති. අක්කර 30,000 ක කුඹුරු ගොවිතැන සඳහා ජලය සපයනු ලබයි. වාන් දොරවල් 10 කින් මෙය සමන්විත වේ.

ඊට අමතරව වියායාත්තකුලම් වැව හා යෝධ වැව මගින් කුඩා වැව් වලට ජලය සපයා ඇත.



Malvathu oya


• Giants tank


Thekkam Anicut


## ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ජන සංගණනය.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාල පිලිබඳ විස්තර. | සංගණන එකතුව. |
|---|---|
| මන්නාරම | 50,931 |
| ණානාට්ටාන් | 17,844 |
| මුසලි | 8,009 |
| මාන්තෛ බටහිර | 14,630 |
| මඩු | 7,631 |
| **එකතුව** | **99,051** |




## ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල වර්ග ප්‍රමාණය.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාල පිලිබඳ විස්තර. | වර්ගප්‍රමාණය | |
|---|---|---|
| | වර්ග කි.මී. | ප්‍රතිශතය |
| මන්නාරම | 226.88 | 11.33 |
| නානාට්ටාන් | 129.25 | 6.46 |
| මුසලි | 474.22 | 23.69 |
| මාන්තෛ බටහිර | 658.90 | 32.91 |
| මඩු | 512.82 | 25.61 |
| **එකතුව** | **2,002.07** | **100.00** |





ජන සංගණන එකතුව 99,051 පමන වේ. 80,568 දෙමළ ජාතිකයන්ද, 16,087 මුස්ලිම් ජනතාවද, 394 ඉන්දියානු දෙමළ වශයෙන්ද, 1961 සිංහල ජනතාව සහ 41 වෙනත් ජනකොටස් මෙහි ජීවත් වෙති.

## ➢ දිස්ත්‍රික්කයේ සංඛ්‍යාලේඛනය

| | |
|---|---|
| ✓ දිස්ත්‍රික්කයේ නම | : මන්නාරම. |
| ✓ පළාතේ නම | : උතුරු පළාත |
| ✓ මුළු ඉඩ ප්‍රමාණය | : වර්ග කි.මී. 2002 |
| ✓ ප්‍රාදේශිය ලේකම කාර්යාල ගණන | : 05 |
| ✓ ග්‍රාම නිලධාරි වසම් ගණන | : 153 |
| ✓ ගම් ගණන | : 622 |
| ✓ මහ නගරසභා ගණන | : නැත. |
| ✓ නගරසභා ගණන | : 01 |
| ✓ ප්‍රාදේශිය සභා ගණන | : 04 |
| ✓ නිවාඩු නිකේතන, රජයේ නිළ නිවාස | : 02(01 වැඩ කරමින් පවති) 33 |
| ✓ කලාප අධ්‍යාපන කාර්යාල සේවක ගණන | : 99 |
| ✓ පාසල් හා ගුරුවරුන් ගණන | : 80 හා 1,386 |
| ✓ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් ගණන | : 06 |
| ✓ පළාත්සභා සභිකයන් ගණන | : නැත |
| ✓ පළාත් පාලන මන්ත්‍රීවරුන් ගණන | : 46 |
| ✓ ජන සංගණනය | : 99,051 (2012 ජනසංගණන) (154,590 අවතැන් වූවන් ලියාපදිංචිය සමග) |

## ➢ ආයතන ව්‍යුAහය සහ අනුමකාර්ය මණ්ඩල තොරතුරු, සංවිධාන සිතියම



| වර්ගය | කළමනාකරන සේවයේ චක්‍රලේඛනය අනුව අනුමත කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | කාර්ය මණ්ඩල සංඛ්‍යාවේ තනතුරු | පුරප්පාඩු |
|---|---|---|---|
| **දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මන්නාරම** | | | |
| අධි ශ්‍රේණිය A | 01 | 01 | - |
| තුන්වන ශ්‍රේණිය B | 06 | 05 | 01 |
| දෙවන ශ්‍රේණිය C | 27 | 19 | 08 |
| පලමු ශ්‍රේණිය D | 13 | 10 | 03 |
| තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම | | අනියම් -02<br>කොන්ත්‍රාත් පදනම -01 | |
| **ප්‍රාදේශිය ලේකම් කාර්යාල, මන්නාරම** | | | |
| තුන්වන ශ්‍රේණිය B | 25 | 11 | 14 |
| දෙවන ශ්‍රේණිය C | 279 | 196 | 83 |
| පලමු ශ්‍රේණිය D | 40 | 26 | 14 |
| තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම | | අනියම් -03<br>කොන්ත්‍රාත් පදනම -07 | |

## 01. පොදු පරිපාලන කටයුතු

### ➤ පරිපාලන කටයුතු

දිස්ත්‍රික්කය පරිපාලන වශයෙන් මන්නාරම නගරය, නානාට්ටාන්, මුසලි, මඩු, මාන්තෛ බටහිර, වශයෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 05 කට බෙදා තිබේ. මඩු, මාන්තෛ බටහිර යන උප දිසාපති කොට්ඨාශ 02 ක් 2011.04.06 වන දින සිට 'ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ' වශයෙන් උසස්වී ඇති බව 1742/7 දරන 2012.01.24 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශ කරන ලදි.

මෙම දිස්ත්‍රික්කයේ 153 ක් ග්‍රාම නිලධාරි වසම් ඇති නමුත් 2012 වසරේ ග්‍රාම නිලධාරීන් 116 ක් පමණක් සේවය කරන අතර ග්‍රාම නිලධාරි වසම්වල 37 ක් පුරප්පාඩු පවති. දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශිය ලෙකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති රාජ්‍ය කළමණාකරන සහකාර මට්ටමෙන් 45 ක් පුරප්පාඩු වශයෙන් ගණනය කර ඇත. කාර්යාල සුළු සේවක වශයෙන් එම නව පත්වීම් ලබා කාර්යාල සහායක දෙදෙනෙක් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සෙවයට අනයුක්ත කරන ලදි.

ප්‍රාදේශිය ලේකම් කාර්යල මගින් මහ ජනතාවට ජාතික හැඳුනුම්පත් ලබාගැනීම සඳහා 4117 ක් ඉල්ලුම් පත්‍ර පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත අදාල ලියකියවිලි සමඟ යවන ලදි.

ශ්‍රී ලංකා ගමන් බල පත්‍ර ලබාගැනීම සඳහා මහ ජනතාවගෙන් 609 ක් ඉල්ලුම පත්‍ර ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් යවන ලදි. අතිරේක දිසාපති එස්.මෝහනාදන් මහත්මිය වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ස්ථාන මාරු ලබාගත් අතර ඒ. ස්ටැන්ලි ඩිමෙල් මහත්මිය 2012.07.30 දින සිට මන්නාරම දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති ධුරයට පත්විය.

2012 වසරේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012.06.28 හා 2012.09.20 වන දිනයන් හිදි උපාධි ධාරීන් 399 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. මෙම පරීක්ෂණය මගින් 2012.07.02 හා 2012.09.20 වන දිනයන් හිදී උපාධි ධාරි අභ්‍යාස ලාභීට 284 දෙනෙකුට ඔවුන්ගේ විශය මට්ටමට අනුකූලව පහත සඳහන් අමාත්‍යාංශ වලට, දෙපාර්තමේන්තු වලට හා කාර්යාල වලට, උපාධි ධාරි අභ්‍යාස ලාභි වශයෙන් පත්වීම ලබා සේවයට අනුයුක්ත කොට ඇත.

| අංකය | අනුයුක්ත කරන ලද කොට්ඨාශය | ගණන |
|---|---|---|
| 01 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 168 |
| 02 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 05 |
| 03 | මුල් ළමාවිය සංවර්ධන අමාත්‍යාංශය | 02 |
| 04 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 02 |
| 05 | රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | 05 |
| 06 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 26 |
| 07 | ජාතික ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව | 02 |
| 08 | ඉඩම් පරිහරන හා සැලසුම් ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 03 |
| 09 | පරිසර අමාත්‍යාංශය | 01 |
| 10 | පාරම්පරික හා කුඩාකර්මාන්ත අමාත්‍යාංශය | 01 |
| 11 | මිණින්දෝරු දෙපාර්තමේන්තුව | 01 |
| 12 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 03 |
| 13 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 01 |
| 14 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 06 |
| 15 | ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 03 |
| 16 | ආපදා කළමණා කරන අමාත්‍යාංශය | 06 |
| 17 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 02 |
| 18 | පළාත්පාලන හා පළාත් සභා අමාත්‍යාංශය | 08 |

| | | |
|---|---|---|
| 19 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 10 |
| 20 | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | 26 |
| 21 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 01 |
| 22 | අධිකරන අමාත්‍යාංශය | 02 |
| | එකතුව | 284 |

- **අභ්‍යන්තර විගණන කටයුතු**

දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක් හා එයට සම්බන්ධවී ඇති දෙපාර්තමේන්තු තුලින් ගෙවීම් කරන ලද ලිපි ලේඛන පරික්ෂා කිරීම හා පද්ධති විගණන, කලමනාකරන විගණන, මූල්‍ය විගණන යටතේ විගණනය කරන ලදි.

මේ යටතේ ඉටු කරන ක්‍රියාකාරකම් මෙසේය, මන්නාරම දිස්ත්‍රික්කය යටතේ පවත්වාගෙන යන සියළුම කාර්යාල වල පැමිණීමේ ලෙඛන, ඉදිරි වැඩසටහන්, සංසෝධන වැඩසටහන්, දිනපොත් උපුටුන යන ලිපි ලේඛන පරික්ෂා කිරීම.

දිස්ත්‍රික් ලේකම්ගේ පරිපාලනය යටතේ වෙන් කරන ලද සියළුම වාහන නඩත්තු කිරීම හා ඉනධන සැපයිම, දෛනික ධාවනපත අනිකුත් සටහන් පත්‍රිකා යන ලිපි ලේඛන පරික්ෂා කිරීම. දිවි නැගුම වැඩසටහන යටතේ ගෙවන ලද වවුචර් පත් හා ර්ට අදාලවන ලිපි ලේඛන පරික්ෂා කිරීම.කාර්යාල පරිසරය, ගොඩනැගිලි නඩත්තු කිරීම, අනෙකුත් පරිපාලනයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉදි කරන ලද ගොඩනැගිලි නඩත්තු කිරීම පිළිබඳව පරික්ෂා කිරීම.

රාජ්‍ය කලමනාකරන සහකාර විසින් පවත්වාගෙන යන ලිපිගොනු ක්‍රමය, ලිපිගොනු භාවිතා කිරීමේ ක්‍රමය, කාර්යාල සංවිධාන ව්‍යූහය යන සියල්ල යලි පරික්ෂාවට ලක්කිරීම. මුදල් අංශයේ මුදල් පොත, සුළු මුදල් පොත, සරප්ගේ ගෙවීම් පොත, මෝටර් රථ කොමසාරිස්ගේ ආදායම් බලපත් ලේඛන පරීක්ෂණය, මුදල් තැන්පතු බැංකු වාර්තා පරික්ෂා කිරීම.

ග්‍රාම නිලධාරින්ගේ කාර්යාල පරීක්ෂණය හා ඔවුන් පවත්වාගෙන යන ලිපිගොනු හා ක්‍රියාමාර්ග, මහජන සම්බන්ධීකරනය, කාර්‍යක්ෂමතා පරික්ෂා කිරීම.

- **ආදායම් එකතු කිරීම.**

2012 වසරේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ලබා ගන්නා ලද ආදායම් විස්තර පහත සඳහන් වේ.

| ශීර්ෂය | මුදල |
|---|---|
| 2002-01-01 | 863,283.03 |
| 2002-02-99 | 1,586,044.94 |
| 2004-01-00 | 4,051,825.57 |
| 2003-02-99 | 4,400.00 |
| 1003-07-03 | 47,400.00 |
| 2003-02-13 | 854,700.00 |
| 2003-99-00 | 3,424,368.82 |
| 2003-02-14 | 8,199,370.00 |
| 2003-02-07 | 1,266,700.00 |
| 1003-07-99 | 17,145.00 |
| 2003-02-06 | 12,475.00 |
| 2002-01-99 | 61,018.56 |
| 1003-07-05 | 400.00 |

- **මැතිවරන කටයුතු**

2012 වසරේ ජන්ද හිමි නාමලේඛනයේ සංගණන හා ජන්ද කටයුතු ග්‍රාම නිළධාරින් ,රාජ්‍ය කළමණාකරන සහකාර,කාර්යාල කාර්ය සහකාර නිලධාරීන්ගේ සහභාගීත්වය යටතේ විශේෂයෙන් පවත්වන ලදි. තවද ජන්ද හිමි නාමලේඛන සංසෝධන කටයුතු ජුනි මස 01 වනදා ආරම්භ කල අතර මේ සඳහාවන ප්‍රධාන කටයුතු වෙනුවෙන් ග්‍රාම නිලධාරින් මගින් සංගණන කටයුතු සම්බන්ධ පුහුණු පංති පවත්වා ඇති අතර ර්ට අමතරව ග්‍රාම නලධාරීන් නිවෙස් කරා ගොස් ජන්ද හිමි නාම සංගණන කටයුතු ආරම්භ කොට ඇත.

අදාල කාලය තුළ ලියාච්දිංචි නොකල අය සඳහා නොවැම්බර්මස දක්වා අවස්තාවක ලබාදී හිමිකම් ඉල්ලීම, විමසීම අන්තර්ග්‍රහනය කොට ඇත. 2012 දෙසැම්බර් මස 31 වන දින එය ගණනන් කිරීමේ නිලධාරීන්ගේ සහභාගීත්වයත් සමග සහතික කර මහජනතාවගේ ප්‍රදර්ශනය සඳහා තබා ඇත. තවද ලියාපදිංචි කිරීම් සම්බන්ධව වරකට වඩා ලියාපදිංචි කරන ලද ජන්ද හිමි නාමයන් විස්තර නිවැරදි කරන ලදි.

- **රෙජිස්ටාර් ජෙනරාල් දෙපාර්තමේන්තු කටයුතු**

2012 දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලය මගින් 4,496 ක් ඉඩම් ඔප්පු ලියාපදිංචි කරන අතර 4,267 ක් ඔප්පු අනු පිටපත් ලබාදී ඇත.

තවද 4,681 ක් ඉල්ලුම්පත්, පිටපත් ලබාගැනීම සඳහාද ඉල්ලුම්පත් සොයාගැනීම සඳහාද ලබා දෙන ලදි. ලියාපදිංචි කිරීම සඳහා රු. 12,093/= ක් හා ලිපි ලේඛන සොයා ගැනීම සඳහා ගාස්තුව වශයෙන් රු. 52,597.50 අනු පිටපත් සඳහා මුද්දර ගාස්තු වශයෙන් රු.13,655,332/= ලැබී ඇත.

සිවිල් ලියාපදිංචි කිරීම යටතේ විවාහ ලියාපදිංචි කිරීම් 197 ක් සිදු කර ඇති අතර 257 ක් අනුමාන වයස් සහතික නකුත් කරන ලදි. විවාහ, උප්පැන් හා මරණ සහතික, අනිකුත් අනුමාන වයස් සහතික අනු පිටපත් ලබා ගැනීම සඳහා 4,742 ක් ඉල්ලුම් පත්‍ර ලබා ඇති අතර 8,135 ක් අනු පිටපත් නිකුත් කරන ලදි. මේ සඳහා මුද්දර ගාස්තු වශයෙන් රු.131,545/= මුදලක් ලබා ගෙන ඇත. භාෂා පරිවර්තන සඳහා ඉල්ලුම් පත්‍ර 189 ක් සඳහා අනු පිටපත් 269 ක් නිකුත් කරන ලදි.මේ සඳහා රු.26,900/= ක මුදලක් මද්දර ගාස්තු වශයෙන් ලබාගනු ලැබේ.

**ජංගම සේවා පැවැත්වීම් පිළිබඳ විස්තර,**

| අංකය | දිනය | ස්ථානය | අනුග්‍රාහක ආයතනය |
|---|---|---|---|
| 01 | 19.02.2012 | ආණ්ඩාන් කුලම් R.C.T.M.S | පුරවැසි කමිටුව මන්නාරම |
| 02 | 04.03.2012 | කල්ලියඩි G.T.M.S | පුරවැසි කමිටුව මන්නාරම |
| 03 | 25.03.2012 | ඉළුප්පෙ කුලම් G.T.M.S | පුරවැසි කමිටුව මන්නාරම |
| 04 | 22.04.2012 | තලෛමන්නාරම R.C.T.M.S | පුරවැසි කමිටුව මන්නාරම |
| 05 | 27.05.2012 | මඩු සිංහල මහා විද්‍යාලය | පුරවැසි කමිටුව මන්නාරම |
| 06 | 17.06.2012 | පෙරිය පණ්ඩිවිරිච්චාන් R.C.T.M.S | පුරවැසි කමිටුව මන්නාරම |
| 07 | 21.07.2012 | කට්ටෛඅඩම්පන් R.C.T.M.S | UNDP ජාතික භාෂා හා ඒකාබද්ධතා අමාත්‍යංශය |
| 08 | 26.09.2012 | ප්‍රාදේශිය ලේකම් නානට්ටාන් | UNDP ජාතික භාෂා හා ඒකාබද්ධතා අමාත්‍යංශය |
| 09 | 18.12.2012 | ප්‍රාදේශිය ලේකම් මුසලි | UNDP ජාතික භාෂා හා ඒකාබද්ධතා අමාත්‍යංශය |
| 10 | 19.12.2012 | ප්‍රාදේශිය ලේකම් මාන්තෙ බටහිර | UNDP ජාතික භාෂා හා ඒකාබද්ධතා අමාත්‍යංශය |
| 11 | 20.12.2012 | ප්‍රාදේශිය ලේකම් මන්නාරම | UNDP ජාතික භාෂාහා ඒකාබද්ධතා අමාත්‍යංශය |

## ➢ ආපදා කළමණා කරන කටයුතු

ආපදා කළමණා කරන කමිටු මගින් අප දිස්ත්‍රික්කය සඳහා ක්‍රියා කර ඇති අයුරු පහත සඳහන්වේ.

01. ආපදා සඳහා සූදානම් කිරීම හා ප්‍රතිසංස්කරනය කිරීමේ ව්‍යාපෘතිය.
02. ආපදා අඩු කිරීමේ ව්‍යාපෘතිය.
03. පාඨමාලා හා පුහුණු පංති පැවැත්වීම.
04. ස්වභාවික ආපදා සහනධාර, පුණරුත්ථාපන හා ප්‍රතිසංස්කරන ගොඩනැගිලි කටයුතු.
05. ගංවතුර සහනාධාර.


ග්‍රාම නිලධාරී වසම් 56 ක් සහ පාසල් 20 ක් ආපදා සඳහා සූදානම් කිරීමේ කටයුතු සකස් කරන ලදි.හදිසි අවස්තා කටයුතු සඳහා වන විස්තරය පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තුවට සපයන ලදි. ආපදා අවස්ථාවේ සුභසාධන මධ්‍යස්ථාන වශයෙන් ප්‍රජා ශාලා 10 ක් තෝරා එහි සියළු පහසුකම් ස්ථාපනය කරන ලදි.

ගං වතුර ආපදා මගින් අහිමි වූ ගම්මාන සඳහා ඇළ මාර්ග හා බැමි, පුවරු සකස් කිරීම සඳහා රුපියල් මිලියන 34 ක් වැය කරන ලදි. ආපදා අඩු කිරීමේ ව්‍යාපෘති සඳහා 'ප්‍රැක්ටිකල් ඇක්ෂන් 'ආයතනය මගින් රුපියල් මිලියන 2.6 ක්ද ශ්‍රී ලංකා රතු කුරුස සංගමය ඔස්සේ රුපියල් මිලියන 4.2 ක් ලබාදී ඇත. ආපදා අඩු කිරීම හා නතර කිරීම සඳහා විවිධ පුහුණු කිරීම් සිදු කරන ලදි.

| පුහුණු වර්ගය | ගණන |
|---|---|
| දිස්ත්‍රික් ආපදා කමිටුවේ සාමාජිකයින්ගේ පුහුණුව. | 03 |
| දිස්ත්‍රික් ආපදා කමිටුවේ සාමාජිකයින්ගේ පුහුණුව. | 08 |
| ග්‍රාම නිලධාරි වසම් වල ආපදා වලක්වා ගැනීමේ පෙරසූදානම් වැඩමුළු | 196 |
| පාසල් මට්ටම ආපදා වලක්වා ගැනීමේ පෙරසූදානම් වැඩමුළු | 86 |
| පළාත්පාලන දෙපාර්තමේන්තුවේ ආපදා වලක්වා ගැනීමේ පෙරසූදානම් වැඩමුළු | 05 |

ගංවතුර සහනාධාර සඳහා, පිසින ලද ආහාර, වියලි සලාක හා අනෙකුත් හදිසි කටයුතු වලට රුපියල් මිලියන 6.0 ක් වැය කර ඇත. නියගය නිසා ඇති වූ තත්ත්වය හේතුවෙන් ග්‍රාමීය පවුල් සඳහා පානීය ජලය සැපයීමට රුපියල් මිලියන 18 ක් හා වැව් හා ළිං ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 10 පාණීය ජල ටැංකි ඉදි කිරීමට රුපියල් මිලියන 4 ක් වැය කරන ලදි.











## 02. සංස්කෘතික හා සමාජ සේවා

➢ **සංස්කෘතික කටයුතු**

❖ **මරුද මඩු මාතා දෙවස්ථානය හා තිරුකේතීශ්වරම් කොවිළ**

ඉතා විශේෂ ස්ථාන වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. මඩු උත්සවය ජූලි හා අගෝස්තු මසද, මහ ශිව රාත්‍රි උත්සවය පෙබරවාරි මාසයේද පවත්වන ලදි. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් විවිධ පිරිස් මේ සඳහා සහභාගි විය.



❖ **හින්දු ආගමික පොදු තරඟ විභාගය**

හින්දු ආගමික සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් 2012.06.09 වන දින මන්/ සිත්ති විනායගර් හින්දු ජාතික පාසලේ හා මන්/ අඩම්පන් මහ විදුහලේ දී පවත්වන ලදි. සහභාගි වූ 1450 ක් ශිෂ්‍ය පිරිස් අතරින්, 24 ක් දිස්ත්‍රික් මට්ටමින් සමත් වී ඇත. ජාත්‍යන්තර මට්ටමේ 03 ක් සඳහා 2012.09.01 වන දින හින්දු ආගමික සංස්කෘතික දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ප්‍රධානත්වයෙන් බම්බල පිටිය

කදිරේෂන් ශාලාවේ සංවිධානය කරන ලද උළෙලේ දී මුදල් ත්‍යාග හා සහතිකපත් ප්‍රධානය කර ඇත.





### ❖ පුණ්‍යග්‍රාම උත්සව වැඩසටහන

හින්දු ආගමික සංස්කෘතික දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂක කේමලෝජිණී කුමරන් මහත්මිය ප්‍රධානත්වයෙන් වට්ටකණ්ඩල් ග්‍රාමයේ මෙම උළෙල පවත්වන ලදි. මන්නාරම් දිස්ත්‍රික්කයේ අරනෙරි (දහම්පාසල්) ගුරුවරුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, කෝවිලේ දායක සභාවේ සාමාජිකයන් ඇතුළු 500 ට වැඩි පිරිසක් සහභාගි වී ඉතා සතුටින් සමරන්නට යෙදුණි. මෙම උළෙල වෙනුවෙන් රු.5500/= වැයවී ඇත.

### ❖ රාජ්‍ය නාට්‍ය උළෙල

2012.11.19 වන දින අතිරේක දිසාපතිනියගේ ප්‍රධානත්වයෙන් මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී මෙම උළෙල පවත්වන ලදි. මන්නාරම නානාට්ටාන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් පාසල්, කලායතන කණ්ඩායම් 4කින් සමන්විත වී තිබුණි. මෙම කණ්ඩායම් අතරින් ජාත්‍යන්තර මට්ටමේ තරඟ සඳහා කණ්ඩායම් 03 ක් තෝරාගෙන කුසලාන හා ත්‍යාග, සහතික පත් ලබා දෙන ලදි.

1. කලාර්පනා නාට්‍ය පල්ලි
2. කාර්මෙල් කලා මන්ඩ්‍රම්
3. මන් සෙන් සේවියර් බාලිකා විද්‍යාලය

### දහම්පාසල් ගුරු පුහුණුව

තවද දහම්පාසල් ගුරුවරුන් සඳහා පුහුණු පාඨමාලාවක් මන්/ සිත්ති විනායගර් හිනදු ජාතික පාසලේ පවත්වනු ලැබීය. දහම් පාසල් ගුරුවරුන් 90 ක් මෙයට සහභාගි විය. දේශන සඳහා වසන්තා වෛද්‍යනාදන් මහත්මිය, පුලවර් සෙල්ලදුරේ මහතා යන අය සහභාගි විය.

## ➢ ළමා ප්‍රවර්ධන




ළමා ප්‍රවර්ධන හා ළමා අපයෝජන දෙපාර්තමේන්තුව මගින් මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රවර්ධන ඒකකයේ විසින් විවිධ සේවාවන් පවත්වාගෙන යන ලදි.

ළමුන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයන්ට මාසික දීමනාවන්, සුදුසු අයවලුන් සඳහා ලබා දෙන දීමනා, හදිසි ආධාර සැපයුම්, පාසල් උපකරන හා ත්‍රිපෝෂ ලබාදීම යන සේවාවන් ඉටුකරනු ලැබීය. මේ පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| අංකය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | පවත්වාගෙන යන සේවාවන් | ප්‍රතිලාභීන් ගණන | වැය විස්තරය |
|---|---|---|---|---|
| 01 | මන්නාරම, නානාට්ටාන් | ළමුන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයන්ට ලබාදෙන මාසික දීමනා. | 204 | 142,107.00 |
| 02 | මන්නාරම, මුසලි | සුදුසු අයවලුන් සඳහා ලබා දෙන දීමනා. | 19 | 77,500.00 |
| 03 | මන්නාරම, නානාට්ටාන, මුසලි, මඩු, මාන්තෛ බටහිර | සුදුසු අයවලුන් සඳහා ලබා දෙන දීමනා (UNICEF) | 104 | 867,000.00 |
| 04 | මන්නාරම, මඩු, මාන්තෛ බටහිර | ඔලි ඔලි සවි කිරීම සඳහා සාක්ෂි වෙනුවෙන් කොළඹ යාම, සිවනරුල් නිවාසයේ ළමුන් මුලතිවු වලට ස්ථාන මාරු කිරීම. | 25 | 35,959.50 |
| 05 | මන්නාරම, මඩු, මාන්තෛ බටහිර | භාලාපචාර වලට ලක්වූ ළමුන් 'සඳහා ආහාර, ගමන් වියදම් ලබා දීම | 04 | 21,712.50 |
| 06 | දිස්ත්‍රික් ලේකම් කාර්යල | දිස්ත්‍රික් ලේකම් කාර්යල සරැකුම් | - | 77,901.60 |
| 07 | මාන්තෛ බටහිර | හදිසි උපකාර සේවා | 01 | 6,000.00 |
| **වියදම් එකතුව** | | | | 1,228,180.60 |

## ➢ සමාජ සේවා කටයුතු

මන්නාරම දිස්ත්‍රික්කයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සේවාවන් රාශියක් ආරම්භ කර ඇත.





- ස්වයං රැකියා පවත්වාගෙන යාම සඳහා 176 දෙනෙකුට ණය ආධාර ලබා දෙන ලදි. මේ සඳහා රු. 1,845,000/= ක් වැය විය.
- ආබාධිත අය 62 ක් සඳහා යුනිසෙෆ් (unicef) ආයතනය මගින් රු.2,480,000/= ස්වයං රැකියා සඳහා ලබා දෙන ලදි.
- ආබාධිතයින් 136 දෙනෙකු සඳහා රු. 3,000/= ක් බැගින් ලබා දෙනු ලැබින.
- වයස අවුරුදු 70 වඩා වැඩි අයට මහජන ආධාර දීමනා ගෙවීම සඳහා 14,145 දෙනෙකුට රු. 6,353,650/= ලබාදී ඇත. එසේම වයස්ගත 667 සඳහා හැඳුනුම්පත් සකසා දෙනු ලැබිණ.
- පිළිකා රෝගීන් 565 ක් සඳහා රු. 351,850/= සහ දුම් පිළිකා රෝගීන් 199 සඳහා රු.66,200/= ලබාදෙනු ලැබීය.





මෙයට අමතරව වැඩිහිටි හා ළමාදිනය නිමිතිකර මඩු ප්‍රදේශිය ලේකම් කාර්යාලය අනුග්‍රහයෙන් ඉතා උත්කර්ශවත් අන්දමින් පවත්වනු ලැබිණි.

## ➢ දිස්ත්‍රිකකයේ ක්‍රීඩා කටයුතු

2012 වසරේ මන්නාරම දිස්ත්‍රික්කයේ ක්‍රීඩා උත්සවය මුසලි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ 2012.07.13 දින මුසලි මහා විද්‍යාලිය ක්‍රීඩාපිටියේදී උත්කර්ශවත්

අන්දමින් පැවැත්විය. මෙම ක්‍රීඩා තරඟ අවසානයේ මන්නාරම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට පලමුවන ස්ථානයද මාන්තෛ බටහිර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට දෙවන ස්ථානයද වශයෙන් හිමිවිය.

මෙම වසර සඳහා පළාත් ක්‍රීඩා උත්සව පවත්වනු ලැබුවේ උතුරු පලාතට අයත් කිළිනොච්චි දිස්ත්‍රික්කයේය. මෙම උත්සවයේදී මන්නාරම දිස්ත්‍රික්කයට තෙවන ස්ථානය හිමිවිය.

එමෙන්ම සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩා උත්සවය නියෝජනය කරමින් පාපන්දු තරඟාවලියෙන් දෙවන සථානය දිනා ගනිමින් රිදී පදක්කම හිමිකර ගන්නා ලදි.






## ➢ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

මන්නාරම දිස්ත්‍රික්කයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් 2012 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා 2752 ක් රියදුරු බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍ර ලැබී ඇත. රියදුරු බලපත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර 211 ක් ලැබී ඇත. 168 ක් අංක තහඩු නිකුත් කරන ලදි.





පවත්වන ලද විභාගවලට අනුව සුදුසුකම් ලත් අය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් රියදුරු බලපත්‍ර නිකුත් කරනු ලැබිණි.

## ➢ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු

ඉඩම් සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය මගින් මන්නාරම දිස්ත්‍රික්කයේ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වැඩසටහන් දියත් කර ඇත. මේ සඳහා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

විසින් වෙන් කල මුදල රු. 287,000/=ක් වන අතර රු. 271,915/= වැය කරන ලදි. ව්‍යාපෘති වශයෙන්

- පාසල් මට්ටමින් ඉඩම් පරිහරණ සැළසුම්
- ග්‍රාමීය මට්ටමින් ඉඩම් පරිහරණ සැළසුම්
- පුරන් වූ ඉඩම් නැවත පරිහරණයට ගැනීම
- පාසල් මට්ටමින් ඉඩම් පරිහරණ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රන






## 03. සංවර්ධන වැඩමුළු

### ➢ දිවිනැගුම සංවර්ධන වැඩසටහන්

2012 වසරේ මන්නාරම දිස්ත්‍රික්කය තුල දිවිනැගුම වැඩසටහන් (ගෘහ ආර්ථිකය) සඳහා රු.12,000,000/= ප්‍රතිපාදන වෙන් කල අතර රු.6,782,653.15 වියදම් කරන ලදි.

| අංකය | විස්තරය | මුදල් ප්‍රතිපාදන | වියදම |
|---|---|---|---|
| 01 | කෘෂිකර්ම | 3,000,000.00 | 2,902,419.14 |
| 02 | ජීවනාධාර/ මසුන් ඇල්ලීම | 1,000,000.00 | 1,000,626.50 |
| 03 | ස්වයං රැකියා | 1,000,000.00 | 882,669.50 |
| 04 | ස්වයං රැකියා ප්‍රදර්ශන | 1,000,000.00 | 999,909.50 |
| 05 | වියදම් කටයුතු සහ ඒ සම්බන්ධ කටයුතු | 1,000,000.00 | 997,028.51 |
| 06 | ජීවනාධාර සහ ස්වයං රැකියා | 1,000,000.00 | - |
| 07 | දිවිනැගුම | 4,000,000.00 | - |
| **එකතුව** | | **12,000,000.00** | **6,782,653.15** |

ඉහත සඳහන් දිවිනැගුම ස්වයං රැකියා ප්‍රදර්ශනයට රු.2,000,000/= ක් වැය කරන ලදි. මෙයින් 70,000 ක ප්‍රතිලාභීන් පිරිසක් ප්‍රයෝජනය ලබාගන්නා ලදි.

ඉහත බීජ නිශ්පාදන, පලතුරු නිශ්පාදන, මුරුංගා නිශ්පාදන, ආදි කෘෂි ව්‍යාපෘති සඳහා ප්‍රදේශ 05 ට ප්‍රතිපාදන වශයෙන් රු.735,555/= ක් වෙන්කල අතර රු. 694,353/= වැය කරන ලදි.

| කොට්ඨාශ | ලබාගත් බීජ | පවුල් ගණන | පළතුරු බීජ | පවුල් ගණන | මුරුංගා බීජ | පවුල් ගණන |
|---|---|---|---|---|---|---|
| මන්නාරම | 7,000 | 7,000 | 2,510 | 818 | 1,260 | 260 |
| නානාට්ටාන් | 4,515 | 4,515 | 3,250 | 2,750 | 1,300 | 500 |
| මුසලි | 3,060 | 1,505 | 2,750 | 1,083 | 1,200 | 760 |
| මාන්තෛ බටහිර | 5,450 | 1,362 | 2,870 | 748 | 1,500 | 500 |
| මඩු | 2,925 | 2,923 | 2,750 | 750 | 1,250 | 500 |
| **එකතුව** | **22,950** | **17,307** | **14,130** | **6,649** | **6,520** | **2,520** |

ප්‍රදේශය තුල දෙළුම්, දෙහි, පේර, ඇඹරැල්ල සහ ගස් ලබු යන බීජ ලබාදීම පිලිබඳ විස්තරය

| පළතුරු බීජවල නම් | මන්නාරම | නානාට්ටාන් | මුසලි | මාන්තෛ බටහිර | මඩු | එකතුව |
|---|---|---|---|---|---|---|
| දෙළුම | 750 | 750 | 750 | 750 | 750 | 3750 |
| දෙහි | 500 | 500 | 500 | 500 | 500 | 2,500 |
| පේර | 500 | 500 | 500 | 500 | 500 | 2,500 |
| ඇඹරැල්ල | 500 | 500 | 500 | 400 | 500 | 2,400 |
| ගස් ලබු | 260 | 500 | 500 | 720 | 500 | 2,400 |
| **එකතුව** | **2,510** | **2,750** | **2,750** | **2,870** | **2,750** | **13,630** |

ජීවනාධාර සහ ධීවර කටයුතු සඳහා රු.512,226.50 වැය කරන ලදි.

| කොට්ඨාශය | මෑළු පැටවුන් ගණන | පවුල් ගණන |
|---|---|---|
| මන්නාරම | 400 | 40 |
| නානාට්ටාන් | 400 | 40 |
| මුසලි | 400 | 40 |
| මාන්තෛ බටහිර | 400 | 40 |
| මඩු | 400 | 40 |
| **එකතුව** | **2,000** | **200** |

ස්වයං රැකියා සඳහා රු.499,290/= මුදල් ප්‍රතිපාදන වෙන් කරන ලදි. එයින් ආබාධිත 30 දෙනෙකු සඳහා පුහුණු ලබාදීම තල් සංවර්ධන මණ්ඩලය මගින් සිදු කරන ලදි. මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සාමාජිකයින් 20 දෙනෙක්ද, නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සාමාජිකයින් 10 දෙනෙක්ද සඳහා පුහුණු ලබා දෙන ලදි. දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ කජු නිශ්පාදනය සඳහා 700,000/= ප්‍රතිපාදන ලබාදුනි.

| අංකය | කොට්ඨාශය | පැළ ගණන | පවුල් ගණන |
|---|---|---|---|
| | මන්නාරම | 1,500 | 300 |
| | නානාට්ටාන් | 500 | 250 |
| | මුසලි | 1,000 | 14 |
| | මාන්තෛ බටහිර | 1,300 | 272 |
| | මඩු | 1,900 | 36 |
| | **එකතුව** | **5,250** | **872** |

දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ ආහාර නිශ්පාදන, රූප ලාවන්‍ය,යන සංවර්ධන වැඩමුළු පවත්වනු ලැබීය. මේ සඳහා 176 දෙනෙකුට අවස්ථාව හිමි විය.

## ➢ විමධ්‍යගත අය වැය

2012 වසරේ මන්නාරම දිස්ත්‍රික්කයට රු.16,750,000/= මුදල් ප්‍රතිපාදන වෙන් කරන ලදි.

| අංකය | ප්‍රදේශිය ලේකම් කොට්ඨාශ | ප්‍රතිපාදන | වියදම |
|---|---|---|---|
| 01 | මන්නාරම | 9,007,825.00 | 2,864,171.16 |
| 02 | නානාට්ටාන් | 2,073,425.00 | 1,675,140.35 |
| 03 | මුසලි | 2,881,125.00 | 350,980.51 |
| 04 | මාන්තෛ බටහිර | 1,925,675.00 | 892,006.37 |
| 05 | මඩු | 610,700.00 | 586,258.00 |
| 06 | දිස්ත්‍රික් සැලසුම් ලේඛන | 251,250.00 | 19,370.00 |
| **මුළු එකතුව** | | **16,750,000.00** | **6,387,926.39** |

## ➢ උතුරු වසන්තය

2012 වසරේ මන්නාරම දිස්ත්‍රික්කයේ උතුරුවසන්තය ව්‍යාපෘතිය යටතේ, නියගය නිසා ගොවීන්ට සිදුවූ අලාභය හේතුවෙන් ඔවුන්ගේ ආර්ථිකය නැන්වීම සඳහා වැව්, කාණු පද්ධති හා අනෙකුත් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මගින් රුපියල් මිලියන 10 ක මුදලක් වෙන්කර තිබුණු අතර ඒ පළිබඳව විස්තර පහත සඳහන් වේ.

| අංකය | ව්‍යාපෘතියේ නම | අනුමතකල මුදල(රු) | වැයකල මුදල (රු) |
|---|---|---|---|
| 01 | වාරි ඇල, බැම්ම සැකසීම, නොච්චිකුලම. | 10,000,00.00 | 367,750.98 |
| 02 | අහදි මුරිප්පු කාණු පද්ධතිය සැකසීම | | 499,896.00 |
| 03 | සාලම්බන් විලාත්ති කාණු පද්ධතිය සැකසීම | | 915,107.60 |
| 04 | ඇල මාර්ග සෑදීම, මුල්ලි කණ්ඩල්. | | 228,435.20 |
| 05 | මාර්ග පිළිසකර කිරීම, වාට්ටු අංක 7, එරුක්කලම්පිටිය. | | 1,391,181.00 |
| 06 | පොදු නළලිං (04) ඉදිකිරීම, සන්නාර්. | | 1,200,000.00 |
| 07 | පොදු නළලිං (05) ඉදිකිරීම, පෙරිය මඩු | | 1,300,000.00 |
| 08 | පොදු නළලිං ඉදිකිරීම, සින්නපණ්ඩිවිරිච්චාන්. | | 300,000.00 |
| 09 | පොදු නළලිං ඉදිකිරීම,පාලම්පිටිය | | 300,000.00 |
| 10 | ඔට්ටු සාලම්බන් වැව, සාලම්බන් වැව හා පණ්ඩාර් ඉලුප්පෙ වැව පිළිසකර කිරීම. | | 1,135,803.50 |

| | | | |
|---|---|---|---|
| 11 | වන්නි වැව හා පූසාරි වැව පිළිසකර කිරීම. | | 825,360.07 |
| 12 | සෝල මණ්ඩළ වැව පිළිසකර කිරීම | | 387,200.00 |
| 13 | සින්නවලයම්කුලම් වැව පිළිසකර කිරීම | | 284,545.26 |
| 14 | තුවරයඩි වැව පිළිසකර කිරීම | | 385,693.05 |
| 15 | පොදු නළලිං ඉදිකිරීම, සෙට්ටියාර් කට්ටෛයඩම්පන්. | | 300,000.00 |
| 16 | පරිපාලන වියදම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව(මධ්‍යම) මුරුන්ගන්. | | 22,755.00 |
| 17 | පරිපාලන වියදම, දිස්ත්‍රික් ක්‍රමසම්පාදන මහලේකම් කාර්යාලය මන්නාරම. | | 96,272.34 |
| **එකතුව** | | | 10,000,000.00 |

➢ **සමෘධි සංවර්ධන ව්‍යාපෘති**

2012 වසර සඳහා සමෘධි සහනාධාර හා භූමිතෙල් සහනාධාර නිකුත් කරන ලද විස්තර පහත දැක්වේ.

| **කොට්ඨාශය** | **වැය ශීර්ෂය** | **විස්තර** | **මුදල් ප්‍රතිපාධන** | **වැය විස්තර** |
|---|---|---|---|---|
| මන්නාරම | 218-1-1-2-1501 (11) | සමෘධි භූමිතෙල් සහනාධාර | 2,868,000.00 | 2,730,600.00 |
| නානාට්ටාන් | | | 1,140,000.00 | 1,118,200.00 |
| මුසලි | | | 1,572,000.00 | 1,435,400.00 |
| මාන්තෛ බටහිර | | | 2,554,800.00 | 2,507,800.00 |
| මඩු | | | 3,396,000.00 | 3,342,400.00 |
| **සාමාන්‍ය එකතුව** | | | 11,530,800.00 | 11,134,400.00 |
| මන්නාරම | 218-1-1-2-1501 (1) | සමෘධි සහනාධාර | 12,680,000.00 | 12,663,245.00 |
| නානාට්ටාන් | | | 4,474,200.00 | 444,200.00 |
| මුසලි | | | 4,174,815.00 | 4,174,815.00 |
| මාන්තෛ බටහිර | | | 2,009,465.00 | 2,007,865.00 |
| මඩු | | | 4,348,090.00 | 3,261,735.00 |
| **සාමාන්‍ය එකතුව** | | | 27,686,570.00 | 26,556,860.00 |
| **මුළු එකතුව** | | | 39,217,370.00 | 37,691,260.00 |

## ➢ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති

කාන්තාවන් සඳහා ස්වයං රැකියා ස්ථාපිත කිරීම යන අරමුණ යටතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මන්නාරම දිස්ත්‍රික්කයේ එකතුව කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන දෙකක් ඇති අතර මන්නාරම නගරයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය හා නානාට්ටාන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය පවත්වත්වාගෙන යනු ඇත. මෙහි

- ✓ මැහුම් පුහුණු පාඨමාලාව (මාස 06)
- ✓ විවිධ නිර්මාණ, ගෘහ ආර්ථිකය(මාස 03) යන පාඨමාලා 02ක් පවත්වාගෙන යනු ඇත.

සාමාන්‍ය වශයෙන් එක් එක් පුහුණු මධ්‍යස්ථානයේ ශිෂ්‍යයන් 20 ක් බැගින් අධ්‍යාපනය ලබයි. මේ අය සඳහා ගෙවීම් වශයෙන් ඔවුන්ගේ පමේණීම මට්ටමෙන් දෛනිකව රු.100 ක් බැගින් ගෙවන ලදි. ඔවුන් විසින් කරන ලද නිර්මාණයන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රදර්ශනය කරන අතර එමගින් තෝරාගත්තා ලද නිර්මාණයන් පළාත් මට්ටමින්, සමස්ත ලංකා මට්ටමින් (දැයට කිරුළ) ප්‍රදර්ශනය කරන ලදි.
මන්නිරම දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන සමිති 02ක් හා කාන්තා ග්‍රාම සංවර්ධන සංගම මගින් පවත්වාගෙන යන මහ සංගමය ක්‍රියාත්මක වේ.

1. මන්නාරම නගරයේ කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ 2012 වසරේ පළාත් මට්ටමෙන් පැවැත්වෙන තරඟයෙන් ලබා ගත් ත්‍යාග පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| | |
|---|---|
| ✓ රිබන් නිර්මාණ කටයුතු | 01 |
| ✓ ගෘහ විද්‍යාව | 02 |
| ✓ මැහුම් සඳහා | 02 |
| ✓ පොත් ලිවීම | 02 |

2. නානාට්ටාන් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ 2012 වසරේ පළාත් මට්ටමේ තරඟාවලියෙන් ලබාගත් ත්‍යාග පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| | |
|---|---|
| ✓ පින්තාරු කිරීම් | 02 |
| ✓ රිබන් නිර්මාණ කටයුතු | 02 |
| ✓ මැහුම් සඳහා | 02 |

මේ සෙවාවන්

✓ විශ්ව විද්‍යාලවලට තෝරාගත් ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම.

- ✓ ශ්‍රමදාන කටයුතු වලට සහභාගි වීම (රෝහල්වල, පොදු ස්ථානවල... )
- ✓ ඉල්ලීම් පරිධි නොමිලයේ ඉදිකිරීමේ කටයුතු හා අළුත්වැඩියා කිරීමේ කටයුතු වලට සහභාගිවීම.
- ✓ අඩි 100ක් දිගින් මුරුන්ගන් රෝහල වටේට තාප්පයක් ඉදිකර දෙන ලදි.
- ✓ කලාකරුවන් දිරිගැන්වීම.
- ✓ ග්‍රාමසංවර්ධන හා කාන්තා ග්‍රාමසංවර්ධන සමිතිවලට චක්‍රීය ක්‍රම මගින් නය ලබාදෙන ලදි.
- ✓ දිළිඳු ශිෂ්‍යන් සඳහා සපත්තු ලබාදෙන ලදි.
- ✓ ස්වභාවික ආපදා හේතුවෙන් මුහුන පෑ අයට ගං වතුර සහනාධාර ගෙවන ලදි.

## ➢ ඉඩම් හා කෘෂිකර්ම

2012 වසර තුළ මන්නාරම යල කන්නය වගාව 2,735ක් වේ. අපේක්ෂා කල අක්කර 3,359 වගා කර ඇති. භාණ්ඩාගාරය මගින් රු. 30,000,000.00 සමූපකාර සමාති, කෘෂිකර්ම සංවිධාන, SPAM ආයතන සඳහා බෙදාහරින ලදි. (වී මිලදී රැනීම සඳහා)

බෝග නිශ්පාදන දෙපාර්තමේන්තුවට මිලියන 2.16 වෙන්කර ඇත. මිලියන 0.858 ක් මිරිස් වගා කිරීම සඳහා යෙදවූ අතර මිලියන 1.185 ක් රටකජු නිශ්පාදනය සඳහා වෙන් කරන ලදි.

## ➢ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන වලට අනුව දියත් කල ව්‍යාපෘතිය SCAPIN2010-2012

රාජ්‍ය පරිපාලණ හා ස්වදේශ කටයුතු අමාත්‍යංහය මගින් 2010 වසරේ සිට 2012 වසර දක්වා **SCAPIN** ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 10 ක් සඳහා වැය කරන ලද මුදල රුපියල් මිලියන 198.07 කි. මේ සඳහා වැය කල විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘති | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ | වෙන් කල ප්‍රතිපාදන ගණන (මිලියන) | වැය කල මුදල (මිලියන) |
|---|---|---|---|
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල | | 35.00 | 13.12 |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලගේ නිළ නිවස | | 5.00 | |

| | | | |
|---|---|---|---|
| පිරිමි නිළ නිවාස | මුසලි | 9.27 | 2.06 |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල | මඩු | 3.500 | 27.61 |
| උප දිසාපතිගේ නිළ නවස | | 11.13 | 4.65 |
| පිරිමි නිළ නිවාස | | 9.27 | 4.63 |
| මඩු සංචාරක නිවාසය | | 38.00 | 29.23 |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිකිරීම | මාන්තෙ බටහිර | 35.00 | 34.30 |
| උප දිසාපතිගේ නිළ නවස | | 11.13 | 10.56 |
| පිරිමි නිළ නිවාස | | 9.27 | 7.51 |
| **එකතුව** | | **198.07** | **133.65** |









➢ **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති**

## I. නැවත නගාසිටුවීමේ ව්‍යාපෘතිය – RAP

2012 වසර දක්වා නැවත නගාසිටුවීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල මිලියන 1,431.96 ක් වෙන් කල අතර රුපියල් මිලියන 1,026.03 ක් වැය කරන ලදි.

- ✓ ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථාන,
- ✓ ප්‍රජා ශාලා,
- ✓ මාර්ග අළුත්වැඩියා,
- ✓ නව මාර්ග ඉදිකිරීම්,
- ✓ සහල් මෝල සෑදීම්,
- ✓ තෝරාගත් පවුල් සඳහා සහන නය ලබාදීම,
- ✓ වැව් බැමි සැකසීම,
- ✓ ජල සැපයුම් ලබාදීම සඳහා තෝරාගත් ගම් 88ක පවුල් සඳහා නය පහසුකම් ලබාදීම,මෙම වැඩකටයුතු සඳහා මෙම මුදල් වැයකරන ලදි.






ඉහත සඳහන් ග්‍රාම සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 05 ට අයත් ගම් 113ක් නැවත නගාසිටුවීමේ ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරන ලදි.







ජීවනාධාර සඳහා ණය ලබාදීමට සාමාජිකයින් 10,060 සඳහා රුපියල් මිලියන 262.87 ක් ප්‍රතිපාදන වෙන් කරන ලදි.කට්ටුකරෛ වැව ප්‍රතිසංස්කරනය සඳහා රුපියල් මිලියන 507.53 වෙන් කල අතර රුපියල් මිලියන 428 වැය කරන ලදි.



තවද ගොඩනැගිලි අළුත්වැඩියාව යටතේ විවිධසේවා සමූපකාර සමිති අළුත්වැඩියාව හා නව ඉදිකිරීම් සිදු කර ඇත.

## විවිධසේවා සමූපකාර සමිති ඉදි කිරීම් පිළිබඳ විස්තර - නව ඉදිකිරීම්

| කොට්ඨාශය | ගම් | ප්‍රතිපාදන | වියදම් |
|---|---|---|---|
| මන්නාරම | පරප්පෙ කණ්ඩල් | 2,125,000.00 | 1,847,825.00 |
| මුසලි | අරිප්පු, කොක්කුපඩයාන්, පණ්ඩාරවෙලි | 6,375,000.00 | 5,543,475.00 |
| මාන්තෙ බටහිර | කාන්තාන් කුලම්, ආණ්ඩාන් කුලම්, පරප්පෙකණ්ඩල් නෙඩුංකණ්ඩල් | 8,500,000.00 | 7,391,300.00 |

## විවිධසේවා සමූපකාර සමිති ඉදි කිරීම් පිළිබඳ විස්තර- අළුවැඩියා

| කොට්ඨාශය | ගම් | ප්‍රතිපාදන | වියදම් |
|---|---|---|---|
| මුසලි | සවේරියාර් පුරම් | 439,488.00 | 355,606.00 |

## ii. මන්නාරම දිස්ත්‍රික්කයේ අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම වෙනුවෙන් කළ කඩිනම් සංවර්ධන ව්‍යාපෘති.

01. අවතැන් වී සිට නැවත පදිංචි කරන ජනතාවගේ ආර්ථිකය ගොඩනැන්වීම සඳහා වර්ෂ 2020 දක්වා කාලයට ඇතුලත්ව සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම.

02. එක් ආදර්ශ ව්‍යාපෘතියක් දියත් කර ඒ මගින් ලබන ලද ප්‍රතිඵල මත දිගුකාලීන ව්‍යාපෘති සකස් කිරීම.

මෙම ආදර්ශ ව්‍යාපෘති සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 300 ක ප්‍රමාණයක් ඇස්තමේන්තු කර ඇත.

කුඩා ප්‍රමාණයේ පානීය ජල ව්‍යාපෘති 70 ක්, ප්‍රජා ශාලා, ග්‍රාමීය මාවත්, වාරි වැව්, සහ රට අමතරව සමාජ සුභසාධනසහ ඉතිරි කිරීම් කණ්ඩායම්, කෘෂිකර්ම හා ධීවර ව්‍යාපෘති සකස් කිරීම.








## අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු හරහා සිදුකරන ලද සංවර්ධන කටයුතු පිළිබඳ විස්තර

| අනු අංකය | අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු | වැය ශීර්ෂය | ප්‍රාග්ධන වියදම | චක්‍රිය වියදම |
|---|---|---|---|---|
| 01 | බුද්ධ සාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 101 | 1,000,000 | - |
| 02 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 105 | - | 13,139,100 |
| 03 | ආපදා කළමණාකරණ අමාත්‍යාංශය | 106 | - | 7,884,500 |
| 04 | අධිකරන අමාත්‍යාංශය | 110 | 86,900 | - |
| 05 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 118 | 1,642,284 | - |
| 06 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 120 | 1,048,445 | 8,258,405 |
| 07 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 121 | 928,000 | 467,084 |
| 08 | සමාජ සේවා අමාත්‍යාංශය | 124 | 488,121 | 6,120,000 |
| 09 | තාක්ෂණික හා පර්යේෂණ අමාත්‍යාංශය | 133 | 3,389,890 | - |
| 10 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 134 | 12,500 | 1,000 |
| 11 | ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 139 | 29,218,995 | - |
| 12 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 145 | | 2,061,061 |
| 13 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 149 | 3,347,042 | - |
| 14 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 153 | 50,000 | - |
| 15 | පරිසර අමාත්‍යාංශය | 160 | 25,000 | - |
| 16 | රාජ්‍ය කළමණාකරණ හා ප්‍රතිසංස්කරන අමාත්‍යාංශය | 173 | 103,700 | - |
| 17 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණික අමාත්‍යාංශය | 185 | 2,977,000 | - |
| 18 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 201 | 100,000 | - |
| 19 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 203 | 3,458,000 | - |
| 20 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 206 | - | 229,356 |
| 21 | පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව | 217 | - | 1,236,000 |
| 22 | සමෘධි කොමසාරිස් ජනරල් දෙපාර්තමේන්තුව | 218 | - | 39,571,970 |
| 23 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 252 | 7,241,041 | 533,402 |
| 24 | විශ්‍රාමවැටුප් දෙපාර්තමේන්තුව | 253 | - | 241,200,000 |
| 25 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 307 | 50,000 | 356,000 |
| 26 | ඉඩම් පරිහරන ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 327 | 287,000 | 839,668 |
| 27 | මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 328 | 3,160 | 15,352 |